www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2006 ඇමරිකානු මැතිවරනයට සමාජවාදී ඉදිරි දර්ශනයක්

**For a socialist alternative in the 2006 US elections**

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**
**2006 ජනවාරි 12**

සමාජවාදී සමානතා පක්ෂය ඇමරිකාවේ 2006 මධ්‍ය වාර මැතිවරනයේ දී ෆෙඩරල් සහ ප්‍රාන්ත නියෝජනයට අපේක්ෂකයන් ඉදිරිපත් කරයි. පාලක ප්‍රභූවේ සහ මහ ව්‍යාපාරිකයන්ගේ ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් පක්ෂ දෙකට එරෙහිව ජනතා දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගීම උදෙසා සසපය හැකි තරම් ප්‍රාන්ත සංඛ්‍යාවක උද්ඝෝෂනය කරනු ඇත.

සසප උද්ඝෝෂනය බුෂ් පරිපාලනයේ යුද්ධයේ, මර්දනයේ සහ සූරා කෑමේ ප්‍රතිපත්තිවලට එරෙහිව ඇමරිකාව ඇතුලත ද ජාත්‍යන්තරව ද පවතින්නා වූ දසලක්ෂ ගනන් වූ කම්කරුවන්ගේ සහ තරුනයන්ගේ විරුද්ධත්වයට හඬක් සහ නායකත්වයක් සපයනු ඇත.

ඇමරිකාව අතිවිශාල දේශපාලන, ආර්ථික, සමාජ සහ සදාචාරාත්මක අර්බුදයක මුවවිටේ පවතී. එය තමන්ගේ ම පුරවැසියන් දසලක්ෂ ගනනක පිළිකුලට ලක් වූ ගෝලීය හා අධිරාජ්‍ය ඉලක්කයන් ඇති ජාතියකි.

බුෂ් පරිපාලනය සිය ඊනියා "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" දියත් කිරීමෙන් අනතුරුව ගත වූ සිව් වසරකට වැඩි කාලය තුල දී, ඇමරිකාවේ ප්‍රතිපත්ති කිසි දා නුවූ විරූ විවෘත ව්‍යවස්ථාවිරෝධී, නීති විරෝධී සහ සාපරාධීමය වූ ගතිලක්ෂන පවා ගැබ් කර ගනී. මුරන්ඩු මිලිටරිවාදයකටත් මනුෂ්‍ය ජීවිතයට සහ අභිමානයට ඇති අලජ්ජි අවඥාවටත් බොරු හේතුවක් ලෙස 9/11 සිදුවීම් යොදා ගන්නා ලදි.

සිය විප්ලවවාදී ආදිකර්තෘන් "ජීවිතය, නිදහස සහ සංතුෂ්ටිය සොයා යාමේ අහිමි කල නොහැකි අයිතිවාසිකම්" ප්‍රකාශයට පත් කල ජාතියකට දැන් නායකත්වය දෙනු ලබන්නේ හබයාස් කෝපුස් "ශ්‍රේෂ්ඨ ආඥා පත්‍රය" අහෝසි කිරීමට මාන බලන්නා වූ ද ඇමරිකානු පුරවැසියන්ට එරෙහිව දැවැන්ත සහ නීති විරෝධී ඔත්තු බැලීම් පවත්වා ගෙන යන්නා වූ ද දේශපාලන මැරවරයන්ගේ කුඩා කල්ලියක් විසිනි. ඇමරිකානු විප්ලවයේ නායකයෝ සිය "මිනිස් වර්ගයාගේ අදහස් පිළිබඳව ශිෂ්ටසම්පන්න ගරු කිරීමක්" ප්‍රකාශයට පත් කලහ. වර්තමානයේ ධවල මන්දිරයේ ලැග සිටින්නා සහ ඔහුගේ කුට්ටාලියෝ ජාත්‍යන්තර නීතිය පිළිබඳ සිය අවඥාව විලිලජ්ජා නැති ලෙස පාරට්ටු කරන අතර වධහිංසා කිරීම යුක්තියුක්ත කරති. ලින්කන් ජනාධිපති ලෙස ''අපගේ හැටිස්වභාවයේ දිව්‍යමය ලක්ෂනයන්ට" ආයාචන කල නමුත් බුෂ් පරිපාලනය ජනගහනයේ ඉතා ම ප්‍රතිගාමී කොටස්වල මූර්ගතම ජන්ම ගතිගුනවලට ආයාචන කරයි.

ප්‍රතිගාමිත්වයට කරන මෙම ආයාචනය තුල අනාගමිකත්වයට හා ඇමරිකා ජනරජයේ බුද්ධිවාදයේ පදනම්වලට කරන නිර්දය ප්‍රහාරයන් සහ ආගමික ආධානග්‍රාහිත්වය සහ අමර්ෂය වගාදිගා කිරීම ද අන්තර්ගත ය. බුෂ් පරිපාලනය සංස්කෘතියේ සහ චින්තනයේ අතීත ජයග්‍රහනයන්ට එරෙහිව ක්‍රමානුකූල ප්‍රහාරයක් දියත් කර තිබේ. මෙයට, ප්‍රකෘති-සෛල පර්යේෂනයන්ට එරෙහි වෙමින්, පරිසර අධ්‍යයනවල සොයා ගැනීම් ප්‍රතික්ෂේප කරමින් සහ පරිනාමය පිළිබඳව ඩාර්විනියානු මතයට එරෙහි ආගමික මූලධර්මවාදී ප්‍රහාරයන් දිරිමත් කරමින් සිදු කරන විද්‍යාවට එරෙහි ප්‍රහාරයන් ද ඇතුලත් වේ.

ඇමරිකාව ඇතුලත්ව ඉරාක යුද්ධයට සහ බුෂ් පරිපාලනයේ දක්ෂිනාංශික දේශීය පිලිවෙත්වලට එරෙහිව අතිදැවැන්ත සහ ගැඹුරට විහිදී ගිය විරුද්ධත්වයක් පවතී. එහෙත් ද්විපක්ෂ ක්‍රමයේ දේශපාලන රාමුව ඇතුලත මෙම විරුද්ධත්වයට අව්‍යාජ සහ ස්වාධීන ප්‍රකාශනයක් අත්පත් කර ගැනීමට මාර්ගයක් නො පවතී.

අන්ත දක්ෂිනාංශික රිපබ්ලිකන් පරිපාලනයට බැරෑරුම් දේශපාලන විරුද්ධත්වයක් පෑම වෙනුවට ඩිමොක්‍රැටික් පක්ෂය එහි නිවට හවුල්කාරයකු ලෙස ක්‍රියා කරයි. මෙම පක්ෂ දෙක එකග වන කාරනා සමග සැසඳීමේ දී ඩිමොක්‍රැටික්වරුන් හා රිපබ්ලිකන්වරුන් අතර වන සියලු වෙනස්කම් නොවැදගත් බව පෙනී යයි. එනම්, ඇමරිකානු සංගත සහ මූල්‍ය ප්‍රභූවේ දේශීය සහ ගෝලීය උවමනාඑපාකම් ඔසවා තැබීමේ ඔවුන්ගේ හවුල්කාර අධිෂ්ඨානය යි.

ඉරාකයේ යුද්ධය නතර කිරීමේ, ඇමරිකානු අධිරාජ්‍යවාදී මිලිටරිවාදය අවසන් කිරීමේ, ප්‍රජාතාන්ත්‍රිය අයිතීන් රැක ගැනීමේ, දුගීකම අහෝසි කිරීමේ සහ සමාජ සමානතාව තහවුරු කිරීමේ අරගලය සඳහා සමාජවාදී ක්‍රියා මාර්ගයක් සහ ඉදිරි දර්ශනයක් මත පදනම් වූ නව ජනතා දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගීම අවශ්‍ය කරයි.

## ජාත්‍යන්තර ක්‍රියා මාර්ගයක අවශ්‍යතාව

ලොව පුරා කම්කරුවන්ගේ පොදු උවමනාවන් ප්‍රකාශයට පත් කරන්නා වූ ද සියලු ම රූපයන්ගේ ජාතික, වාර්ගික සහ ආගමික ස්වෝත්තමවාදයට හා ජාතිවාදයට එරෙහි වන්නා වූ ද ක්‍රියා මාර්ගයක් සහිත එක ම පක්ෂය සසපය වේ.

ඇමරිකාවේ කම්කරුවන් මුහුන දෙන ගැටලු, සාරය වසයෙන් ගත් විට ලෝකයේ අන් සෑම තැනක ම කම්කරුවන් මුහුන දෙන ගැටලුවලට සමාන ය. යුද්ධ, ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට පහර එල්ල වීම, සූරා කෑම, විරැකියාව, දරිද්‍රතාව සහ ස්වාභාවික පරිසරය විනාශ මුඛයේ ලෑම සරලව ම ඇමරිකානු ප්‍රශ්න නො වේ. ඒවා ගෝලීය ප්‍රශ්න වන අතර ඒවාට ගෝලීය විසඳුම් අවශ්‍ය ය.

අපේ කාලයේ ඉහලින් ම ඇති ආර්ථිකමය හා සමාජමය කාරනාව වනුයේ ජාත්‍යන්තර ධනවාදී පද්ධතියේ අසාර්ථකත්වය ය. බිලියන 5ක් ඉක්ම වන ජනකායක් ජීවත් වන ලෝකයක ආර්ථික හා සමාජ තීරන ගැනීමේ සියලු අංශ සංගත ලාභ අවශ්‍යතා හා කුඩා පාලක ප්‍රභුවක් විසින් අතාර්කික ලෙස අතිවිශාල පෞද්ගලික ධනයක් ගොඩ ගසා ගැනීම, යන කාරනාවලට යටත් කරනු ලැබ තිබේ.

විද්‍යාවේ, තාක්ෂනයේ සහ ශ්‍රම ඵලදායිත්වයේ විශ්මිත ඉදිරි පිම් සියලු මනුෂ්‍යයාගේ ජීවන තත්වයන්ගේ නාටකාකාර දියුනුවකට ඉඩ සැලසිය යුතුව තිබුනි. ඒ වෙනුවට ලොව පුරා ම පලල් කම්කරු ජනයාගේ ජීවන තත්වයන් පිරිහෙමින් තිබේ.

2005 වසරේ දී, ආසියානු සුනාමියට දැක්වූ නො තකා හැරීමේ ප්‍රතිචාරයේ සිට කැත්‍රිනා කුනාටු ව්‍යසනයේ ඇමරිකානු ආන්ඩුවේ දුබලතාව දක්වා වූ දෙයින්, ජනතාවගේ අතිමූලික භෞතික අවශ්‍යතාවන් සහතික කර ලීමේ දී පවා මෙම පද්ධතියට ඇති නොහැකියාව තීරනාත්මක ලෙස පෙන්නුම් කර දුන්නේ ය.

ලෝක ආර්ථික යුගයේ ජන සමාජයේ ගැටලු විසඳිය හැකි වනුයේ ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියා මාර්ගයක පදනම මත පමනකි. ලොව සම්පත් තාර්කික, සැලසුම්ගත සහ මානුෂීය ලෙස යොදවා ගැනීම සෑම අවස්ථාවක දී ම, පවත්නා ධනවාදී පද්ධතිය මත පදනම්ව පවතින, ධනය හා බලය සහිත ජාතික පාලක ප්‍රභුවේ උවමනාවන් සමග සට්ටනය වේ.

මහා ව්‍යාපාරිකයෝ ගෝලීයකරනයේ අවතාරය පෙන්වමින් කම්කරු පන්තියට තමන් එල්ල කරන ප්‍රහාර යුක්තියුක්ත කරති. එහෙත්, ආර්ථික දිවියේ සියලු අංශ ගෝලීයව ඒකාග්‍ර වීම ඒ හැටියට ගත් කල ගැඹුරු වන සමාජ අසහනයේ තථ්‍ය හේතුව නො වේ. නිෂ්පාදන බලවේග ගෝලීයව පුලුල් වීම සහ ඒකාබද්ධ වීම තුල ජීවන තත්වයන් අතිවිශාල ලෙස වර්ධනය කිරීමේ ශක්‍යතාව තිබේ. කෙසේ වෙතත්, මෙම බලගතු ආර්ථික සන්තතිය තරගකාරී ජාතික රාජ්‍යවල පාලක ප්‍රභුවේ ලාභ උවමනාවන්ට යටත් කර දැමීම මගින් සමාජ ප්‍රගතිය වලකා දමා තිබේ.

ඇමරිකාවේ හාම්පුතුන් කම්කරුවන්ට දැවැන්ත වැටුප් කප්පාදු පිලිගන්නා ලෙස ද නැත හොත් සිය රැකියා අඩු වැටුප් කලාපවලට පුද කරන ලෙස ද පවසන විට සැලකිල්ලට භාජන කල යුතු කරුන වනුයේ, ඇමරිකානු කම්කරුවන් අන්තර්ජාතික සංගතයන්ගේ ආර්ථික කෘෘරත්වයට එරෙහිව, සමාජවාදය සඳහා ලොව වෙලා ගත් අරගලයකට, ජාත්‍යන්තරව කම්කරුවන් සමග දේශපාලනිකව ඒකාබද්ධ වීමේ අවශ්‍යතාව ය.

සමාජවාදය යනු සමාජ අවශ්‍යතාවේ සහ පොදු යහපතේ පදනම මත ආර්ථික දිවිය යලි සංවිධාන කිරීම ය. එහි අරමුන වනුයේ දරිද්‍රතාව හා මර්දනය මුලිනුපුටා දැමීම සහ සමාජ සමානතාවේ පදනම මත ලොව ජනයාගේ ජීවන තත්වයන් ඉහල නැංවීම ය. එහි අදහස වනුයේ සමාජයේ ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා මත ද ධනය නිපදවන හා බෙදා හැරෙන ක්‍රියාවලීන් මත ද ප්‍රජාතන්ත්‍රවාදී පාලනය මුලුමනින් ම පැතිරීම ය.

## 2006 තීරනාත්මක ගැටලු

2006 මැතිවරනය මත තීරනාත්මක වූ ද එකිනෙක බැඳුනා වූ ද කාරනා තුනක් දැඩිව බලපායි. (1) ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ දැනට පවතින යුද්ධ සහ වඩාත් ලේ වැකි නව මිලිටරි ක්‍රියාවන් සඳහා බුෂ් පරිපාලනයේ පෙර සූදානම; (2) ඇමරිකානු ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතීන් මත ප්‍රහාර එල්ල කිරීම; සහ (3) කම්කරු පන්තියේ ජීවන තත්වයන් මත ආන්ඩුවේ පිටුබලය ඇතිව කෙරෙන ප්‍රහාර සහ ඇමරිකාව තුල සමාජ අසමානතාව දැවැන්තව වර්ධනය වීම යනු මෙම කාරනා ය.

මෙම තීරනාත්මක කාරනා පිලිබඳව සසප පිලිවෙත සංගත ප්‍රභුවේ පක්ෂවල පිලිවෙතින් සුපැහැදිලිව සහ අත්‍යන්තයෙන් ප්‍රතිවිරුද්ධ ය.

ඇමරිකානු හමුදා ඉරාකයෙන් හා ඇෆ්ඝනිස්ථානයෙන් වහා ම ඉවත් කර ගන්නා ලෙස සසපය ඉල්ලා සිටී!

2003 මාර්තුවේ ඉරාක ආක්‍රමනය දියත් කලේ අතිමූලික බොරු මත බව අවිවාදිත කාරනාවකි. ඉරාකයේ ජනඝාතක අවි නොතිබුන අතර ඇමරිකාවට එරෙහිව ප්‍රහාර සූදානම් කිරීමේ දී සදාම් හුසේන් පාලනය අල්කයිඩාව සමග සහයෝගී වී නොතිබුනි.

යුද්ධය දියත් කලේ ත්‍රස්තවාදය සමග සටන් කිරීමට නො ව ඉරාකයේ තීරනාත්මක තෙල් සම්පත් මත ඇමරිකානු ආධිපත්‍යය සාක්ෂාත් කර ගැනීමට සහ මැද පෙරදිග හා මධ්‍යම ආසියාව පුරා ඇමරිකානු බලය ප්‍රක්ෂේපනය කිරීම පිනිස ය.

දේශපාලන සංස්ථාපිතය තුල ඉරාක යුද්ධය පිලිබඳව නිල විවාදය පවත්වන්නේ, මුලුමනින් ම ඊනියා " ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" රාමුව ඇතුලත ය. ලෝක ආධිපත්‍යය සඳහා වන ඇමරිකානු පාලක ප්‍රභූවේ පරිශ්‍රමය යුක්තිසහගත කිරීමට බුෂ් පරිපාලනය ප්‍රයෝගයක් ලෙස යොදා ගන්නා දේශපාලන කෛයිරාටිකකමේ මෙම ව්‍යායාමය සසපය මුලුමනින් ම ප්‍රතික්ෂේප කරයි. ත්‍රස්ත තර්ජනයක් පවතින්නේ යම් දුරකට ද එය ලොව වටා දරිද්‍රතාව සහ මර්දනය ඇති කලා වූ ද ඉන් දැවැන්ත කෝපයක් හා වෛරයක් ජනිත කලා වූ ද ඇමරිකානු අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිවල ම ප්‍රතිඵලයකි.

සසප අපේක්ෂකයන් ඉරාකයෙන් හා ඇෆ්ඝනිස්ථානයෙන් සියලු ඇමරිකානු හමුදා වහා ම හා කොන්දේසි විරහිතව ඉවත් කිරීම සඳහා උද්ඝෝෂනය කරනු ඇත. අපගේ උද්ඝෝෂනය, නීති විරෝධී වූ ද උසි ගැන්වීමකින් තොර වූ ද ඉරාක ආක්‍රමනයට වගකිව යුතු සියල්ලන් ම යුද අපරාධ අධිකරනයක් හමුවේ නඩු විභාගයකට ගෙන එන ලෙසත්, ඇමරිකානු ආන්ඩුව තමන් ඇති කල විනාශයට සහ වේදනාවට, ඉරාක ජනතාවට මෙන් ම යුද්ධයේ දී මිය ගිය ඇමරිකානු සොල්දාදුවන්ගේ පවුල්වලට සහ මානසිකව හා කායිකව අනතුරට ලක් වූ මිනිසුන්ට හා ගැහැනුන්ට ද වන්දි ගෙවන ලෙසත් ඉල්ලා සිටී.

සසපය ප්‍රජාතාන්ත්‍රිය අයිතීන් ආරක්ෂා කිරීම හා පලල් කිරීම ඉල්ලා සිටී

ප්‍රජාතන්ත්‍රවාදය අවසාන විග්‍රහයේ දී ඇමරිකාව තුල පවත්නා ධන සංකේන්ද්‍රනයේ හා සමාජ අසමානතාවේ මට්ටම් සමග එකකට එකක් නො ගැලපේ.

ඉරාක ආක්‍රමනය ප්‍රජාතන්ත්‍රවාදය පැතිරවීමේ යුද්ධයක් ය යන බුෂ්ගේ කියා පෑම සම්පූර්න ලෙස ම නිෂ්ප්‍රභ කෙරුන කාරනාව වනුයේ යුද්ධය ඇමරිකාව තුල ම ප්‍රජාතාන්ත්‍රිය අයිතීන්ට එල්ල කරන ප්‍රහාරය උග්‍ර කිරීමක් සමග එක්ව පැමිනීම ය. "ත්‍රස්තවාදය"ට එරෙහිව "නිදහස" රැකීමේ නාමයෙන් බුෂ් පරිපාලනය පලමු වන හා දෙවන ලෝක යුද සමයන් තුල දී පවා පෙර තිබූ කිසිදු ඇමරිකානු ආන්ඩුවක් අත්පත් කර නොගත් මිලිටරි හා පොලිස් බලතල පවරා ගනිමින් ඇමරිකාව තුල පොලිස් රාජ්‍යයක් සඳහා අවශ්‍ය ආයතනික හා නීතිමය රාමුව අටවා ගෙන තිබේ.

බුෂ් පරිපාලනය ජාත්‍යන්තර නීතිය, ජිනීවා ප්‍රඥප්තිය ඇතුලු විධායක බලය මත තිබූ සියලු නීතිමය පාලනයන් බැහැර කර දමා තිබේ. බුෂ් යටතේ ඇමරිකාව තමන් තෝරා ගත් ඕනෑ ම රටකට පහර දීමට සහ එම රට අත්පත් කර ගැනීමට; වොෂින්ටනය විසින් ඉලක්ක කර ගත් අය නිර්බාධිතව පැහැර ගැනීමට, වධබන්ධනයට ලක් කිරීමට සහ ඝාතනය කිරීමට පවා හැකි වන අයුරු ලොව පුරා පැතිරී ගිය හිර කඳවුරු ජාලයක් පිහිටුවීමට; සහ දේශීය ඔත්තු බැලීමේ, සෙවිල්ලෙන් සිටීමේ සහ කුපිත කරවීමේ දැවැන්ත මෙවලමක් පිහිටුවීමේ අයිතිය තහවුරු කර ගත්තේ ය.

සමාජවාදී සමානතා පක්ෂය දේශප්‍රේමී පනත අවලංගු කර දැමීම, දේශීය ආරක්ෂක දෙපාර්තමේන්තුව අහෝසි කර දැමීම, පෙන්ටගනයේ උත්තර ආඥාපතිත්වය ඉවත් කර දැමීම, ගුවන්තනාමෝ වධකඳවුර සහ එවන් අනෙකුත් ස්ථාන වසා දැමීම සහ වධබන්ධන, බිඳ දැමීම් සහ ඇමරිකානු ජනතාවගේ නාමයෙන් කරනු ලබන එවන් අනෙකුත් කුරිරුකම් අවසන් කර දැමීම ඉල්ලා සිටී.

ප්‍රජාතාන්ත්‍රිය අයිතීන් ආරක්ෂා කිරීම උදෙසා, බුෂ් පරිපාලනය විසින් ඉතා ම ප්‍රතිගාමී වූ දේශපාලන හා සමාජ බලවේග පොලඹවා ගැනීමට සහ අතීතයේ දී දිනා ගත් ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරන අකුලා දැමීමට දරනු ලබන ප්‍රයත්නයන්ට ප්‍රතිප්‍රහාරයන් එල්ල කිරීම අවශ්‍ය කරයි. අතීත ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජ ජයග්‍රහන -- සිවිල් හා ඡන්ද අයිතීන්, සෑම දෙනාට ම අධ්‍යාපනය, වැඩිහිටියන්ට සෞඛ්‍ය ආරක්ෂනය ආදිය -- රැක ගැනීමේ දී මෙන් ම සිවිල් නිදහස පිලිබඳව ව්‍යවස්ථාමය සහතිකයන් රැක ගැනීමේ දී සමාජවාදී සමනතා පක්ෂය වෙහෙස නො බලා සටන් කරයි.

සසපය සියලු දෙනාට ම සමාන අයිතිවාසිකම් ඉල්ලා සිටින අතර රැකියා සැපයීමේ දී, නිවාස සැපයීමේ දී, අධ්‍යාපනයේ දී හෝ වෙනත් ඕනෑ ම ක්ෂේත්‍රයක දී ජාතිය, ජාතික සම්භවය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය හෝ ලිංගික මනාපය මත වෙනස්කම් කිරීමට විරුද්ධ වෙයි. කාන්තාවන්ට තම අවශ්‍යතාව මත ගබ්සා කර ගැනීමට තිබෙන අබාධිත අයිතිය අප ආරක්ෂා කරන අතර සමලිංගික පුද්ගලයන්ට විවාහ වීමට ද විරුද්ධ ලිංගික යුගලයන්ට ලැබෙන සේ ම වෛද්‍ය, නීතිමය සහ රැකියා සහන ලැබීමේ අයිතිය ද ආරක්ෂා කරමු. රාජ්‍යය මගින් මනුෂ්‍ය ජීවිතය පැහැර ගැනීම අනුමත කරන ම්ලේච්ඡ විධිවිධානයක් ලෙසට අපි මරන දන්ඩනයට විරුද්ධ වෙමු. මෙම දඬුවම

මුලුමනින් ම පාහේ පටවා තිබෙන්නේ දුගීන් මත සහ අසමාන අනුපාතයකින් වාර්ගික සුලුතරයන් මත ය.

එහෙත් ප්‍රජාතාන්ත්‍රික අයිතීන් රැක ගැනීම, සිවිල් නිදහස සහ ව්‍යවස්ථාමය විධානයන් මත වන ප්‍රහාරයන් පරාජයට පත් කිරීමේ නිෂේධනීය කාර්යයට පමනක් සීමා කල නොහැකි ය. දියුනු කාර්මික රටවල් අතුරින් ඉතා ම සීමාබන්ධන සහිත ප්‍රජාතන්ත්‍ර විරෝධී එකක් වූ ඇමරිකානු දේශපාලන පද්ධතිය ම රැඩිකල් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමෙන් ආරම්භව ප්‍රජාතාන්ත්‍රික අයිතීන් විශාල වශයෙන් පුලුල් කර ගැනීම කම්කරු පන්තියට අවශ්‍ය ය.

මෙයට, සියලු ම පුරවැසියන්ට ඡන්දය දීමට ඇති බොහෝ සීමාබන්ධන අවසන් කර දමමින් සහ ඩිමොක්‍රැටික්වරුන්ට සහ රිපබ්ලිකන්වරුන්ට අභියෝග කිරීමට මනාප වන තෙවන පක්ෂවල හා ස්වාධීන අපේක්ෂකයන්ට ඇති අසංඛ්‍ය වූ බාධකයන් මුලිනුපුටා දමමින් මැතිවරන විද්‍යාල ක්‍රමය වැනි යල්පිනූ ආයතන අහෝසි කර දැමීම ද අයත් විය යුතු ය. මෙම බාධකයන් බන්ධනගත සහ හිතුවක්කාරී ඡන්දප්‍රවේශ නීතිවල සිට ඩිමොක්‍රැටික් සහ රිපබ්ලිකන් ව්‍යාපාරවලට රාජ්‍ය අරමුදල් සැපයීම හා තෙවන පාර්ශ්ව අපේක්ෂකයන්ට ඇති වන මාධ්‍ය තහංචි දක්වා පරාසයක වෙයි.

බොහෝ විවිධත්වයන් සහිත දසලක්ෂ 300ක ජනගහනයක් සිටින රටක ද්විපක්ෂ ක්‍රමයට ලබා දෙන රාජ්‍ය අනුග්‍රහය සමස්තයක් ලෙස ගත් කල වඩවඩාත් අපකීර්තියට ලක් වී තිබේ. සැලකිය යුතු මට්ටමේ ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා සියලු පක්ෂ ව්‍යවස්ථාදායකයන්හි නියෝජනය වන සමානුපාතික නියෝජන ක්‍රමයක් වෙනුවෙන් සසපය පෙනී සිටී.

ප්‍රජාතාන්ත්‍රික අයිතීන් පිලිබඳව සංකල්පය මත් නීතිය ඉදිරියේ සමානතාව සහ සුදුසු නඩු විභාගයක් යන පටු රාමුවෙන් ඉවතට පුලුල් විය යුතු ය. ඒවා අතිවිශාල කම්කරු ජනයාගේ ජීවිතයේ සමාජ යථාර්ථයන් වෙලා ගත යුතු ය. එබැවින් මෙය පෞද්ගලික ධනය සංකේන්ද්‍රනයට එරෙහි අරගලයෙන් වෙන් කල නොහැකි ය.

ආර්ථික හා සමාජ අසමානතාව හාත්පස පැතිරී තිබෙන සමාජයක නීතිය ඉදිරියේ සමානකම පිලිබඳ සංකල්පය තුල අතිමූලික කුහකකමක් තිබේ. එදිනෙදා ජීවිතයේ ඉතා ම වැදගත් කාරනා (මිනිසුන්ට රැකියාවක් ලැබේ ද, ඔවුන්ට කොතරම් වැටුපක් ලැබේ ද, ඔවුන්ට වැඩ කිරීමට සිදු වනුයේ කුමන කොන්දේසි යටතේ ද) මූල්‍ය කතිපයාධිකාරයක් විසින් ආඥාවට යටත් කෙරෙන විටක වසර දෙකකට හෝ සතරකට වරක් ඡන්දය දීමේ අයිතියෙන් අර්ථ ගැන්වෙන්නේ සොච්චම් දෙයකි.

ප්‍රජාතන්ත්‍රවාදය බොහෝ මිනිසුන්ගේ කාලයෙන් හා මහන්සියෙන් ඉතා වැඩි කොටස ගත කරන වැඩ කරන ස්ථානය ප්‍රජාතන්ත්‍රගත කිරීමෙන් ඇරඹෙන හෘදයංගම සමාජ අන්තර්ගතයක් සමග මුසු විය යුතු ය. කර්මාන්ත ප්‍රජාතන්ත්‍රවාදය යන්නේ අදහස වනුයේ කම්කරුවන්ගේ කම්කරු ජීවිත මත ඔවුන්ගේ ඇත්ත පාලනයකි. වැඩවල කොන්දේසි, ආරක්ෂාව, වැටුප්, බඳවා ගැනීම් සහ වැඩ කාලය පිලිබඳව බලපාන තීන්දු කම්කරු බලකායේ ප්‍රජාතාන්ත්‍රික හඬට යටත් කල යුතු ය. මින් අඟවා සිටින්නේ සියලු සංගතවල පොත්පත් කම්කරුවන්ගේ විමර්ශනයට විවෘත කිරීම සහ සංගත නායකත්වය සියලු සේවකයන්ගේ ප්‍රජාතාන්ත්‍රික ඡන්දයකින් අනුමත කිරීම ය.

"නීතිවිරෝධී පරදේශීන්" ලෙස හංවඩු ගසා ඇති මිලියන 12ක් යැයි තක්සේරු කෙරෙන ලිපිලේඛන රහිත කම්කරුවන් ඇතුලු සියලු සංක්‍රමනිකයන්ට ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහ පුරවැසිකම් සඳහා අපි සහයෝගය දෙමු. ආන්ඩුව විසින් සිය "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" කොටසක් ලෙස කර ගෙන යන සංක්‍රමනිකයන්ට එරෙහි ප්‍රහාර, එනම් වට කර කොටු කරන මාදිලියේ අල්ලා ගැනීම්, රඳවා ගැනීම් සහ පිටුවාහල් කිරීම්, අවසන් කරන ලෙස අපි බල කර සිටිමු.

රැකියා සුරක්ෂිත භාවය, සමාජ සහන පුලුල් කිරීම සහ කම්කරුවන්ගේත් තරුනයන්ගේත් ජීවන තත්වයන් ඉහල දැමීම සඳහා සසපය සටන් කරයි

හොඳ වැටුප් සහිත රැකියා, විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය සහන සහ රජයේ අධ්‍යාපනය වැනි සමාජ සේවාවන් දරා ගත නොහැකි තත්වයකට පත් වී තිබේ යැයි ඇමරිකානු පාලක පන්තිය කියා පායි. ඇමරිකානු සමාජයේ ඉහල ම සියයට එකෙහි දිගින්දිගට ම ඉහල යන පුද්ගලික ධනස්කන්ධයන් තවතවත් ප්‍රසාරනය කිරීම සඳහා ඒවා කැප කර දැමිය යුතු බව ප්‍රකාශ කර සිටී.

මිලියන ගනන් අතිරේක ධනය සිය බැංකු ගිනුම්වල පුරවමින් තමන් ම නිර්මානය කල ව්‍යසනයෙන් විධායක නිලධාරීන් පලා යමින් කම්කරු පන්තික ජනයා මහා විනාශයකට ඇද දැමුවා වූ සංගත බංකොලොත් වීම්වලට කම්කරු පන්තියේ කිසිදු වගකීමක් ද නැතැයිද, සසපය පිලිතුරු දෙයි.

හොඳින් ම දන්නා සමාගම් දෙකක් ගැන පමනක් සඳහන් කල හොත්; ජෙනරල් මෝටර්ස් සහ යුනයිටඩ් එයාර්ලයින් වැනි ඇමරිකානු ව්‍යවසායකයේ ප්‍රතිමාස්තම්භවල නාටකාකාර අසාර්ථකත්වය ඇමරිකානු ධනවාදයේ මහා අර්බුදය පිලිබඳව නොවරදින තහවුරු කිරීමකි.

"නිදහස් වෙලඳ ආයතන"වලින් නිර්මිත ඇමරිකානු සමාජ පද්ධතියට කම්කරුවන් සඳහා ඉහල වැටුප්, විපුල සමාජ සහන සහ සුරක්ෂිත, සුවපහසු විශ්‍රාම දිවියක් සහතික කර දිය හැකි යැයි මහා ව්‍යාපාරිකයන්ගේ ක්ෂමාලාපකයෝ දශක ගනනාවක් මුලුල්ලේ කියමින් සිටියෝ ය. ධනවාදයට කම්කරුවන් සඳහා ඉහල ජීවන තත්වයක් සැලසිය හැකිව තිබිය දී සමාජවාදයේ අවශ්‍යතාවක් නැතැයි සංගතවල රැවටිලිකාරයෝ ප්‍රකාශ කර සිටියහ.

ඇමරිකානු දිවියේ ආර්ථික සාධක විසින් මේ තකතිරු රැවටිලිසහගත ක්‍රියා මාර්ග නිෂ්ප්‍රභ කර දමා තිබේ.

ඇමරිකාවේ දල දේශීය නිෂ්පාදිතය යථා වසයෙන් ගත් කල 1972 සිට සියයට 50ක වර්ධනයක් ලබා තිබේ. ඒ අනුව ම ඒකපුද්ගල දල දේශීය නිෂ්පාදිතය ද සෑහෙන ප්‍රමානයකින් ඉහල ගොස් තිබේ. මෙහි අර්ථය වනුයේ සමාජයක් ලෙසට හොඳ වැටුප් ඇති රැකියා, සෞඛ්‍ය සහන, සුරක්ෂිත විශ්‍රාම දීමනා, යහපත් රාජ්‍ය සේවයක් වැනි කම්කරුවන්ගේ මූලික අවශ්‍යතා සපුරා දීම වඩා අපහසු නො ව වඩාත් පහසු විය යුතු බව ය. එහෙත්, ඇමරිකානු කම්කරුවාගේ පැයක මූර්ත වැටුප පහල ගොස්, පවුල් ආදායම එක තැන රැඳී, විශ්‍රාම දීමනා මුලුමනින් විනාශ වී, සෞඛ්‍ය ආරක්ෂනය සහ අධ්‍යාපනය වැනි තීරනාත්මක සමාජ සේවාවන්වල අරමුදල් සිඳී ගොස් ඇත.

පසු ගිය වසර 30 මුලුල්ලේ ආර්ථික ඵලදායිතාව දැවැන්තව වර්ධනය වී තිබෙන නමුත් වැඩ කරන මිනිසුන්ට ඉන් ලැබී ඇත්තේ සොච්චමකි, නැත හොත් කිසිවක් ම ලැබී නැත. මේ වෙනුවට ප්‍රසාරනය වූ ධනය ඇමරිකානු සමාජය මුදුනත කුඩා කන්ඩායමක් විසින් සියතේ රඳවා ගනු ලැබ තිබේ. ඇමරිකානු ජනගහනයේ ඉසුරුමත් ම සියයට 1, 1979 සිට ජාතික ධනයේ සිය පංගුව සියයට 19 සිට සියයට 40 දක්වා දෙගුනයකටත් වඩා ඉහල දමා ගෙන තිබේ.

සාමාන්‍යයක් වසයෙන් ගත් විට, සංගතවල ප්‍රධාන විධායකයන්, සාමාන්‍ය කම්කරුවකුගේ වැටුප මෙන් 431ක් ගුනයක් ලබා ගනී. පසු ගිය වසරේ කම්කරුවන් ලද සියයට 4ට සන්සන්දනාත්මකව සංගත විධායකයන්ගේ වැටුප සියයට 91කින් ඉහල ගොස් තිබේ.

2005 ඔක්තෝබරයේ දී *නිව් යෝක් ටයිම්ස්* පුවත්පතේ වාර්තා වූ දේශීය ආදායම් සේවාවක අධ්‍යයනයක ඇමරිකාවේ වේගයෙන් ඉහල යන ආදායම් අසමානතා මට්ටම් ලේඛනගත කර තිබුනි. විස්තෘත සංඛ්‍යා ලේඛන ලැබී තිබුන අවසාන වර්ෂය වන 2003 දී ඉහල ම සියයට 1 සමස්ත ඇමරිකාව ම ලබා ගෙන තිබූ සත්‍ය ආදායම් වර්ධනය මුලුමනින් ම ගිල දමා තිබුනි.

ධනය සුපිරි ධනවතුන්ගෙන් ලබා ගෙන එම සම්පත් සියල්ලන්ගේ ම යහපත සඳහා භාවිත කරන දුරදිග යන යලි බෙදා හැරීමක් ඉටු කිරීම හදිසි සමාජ අවශ්‍යතාවක් බවට පත්ව තිබේ. ආර්ථික ජීවිතය තාර්කික, මානුෂීය පදනම්, එනම්, සමාජවාදී පදනම මත යලි සංවිධානය කරන සේ අපි ඉල්ලා සිටිමු: එනම්, කම්කරු පන්තිය විසින් නිපදවනු ලබන ධනය දැවැන්ත සංගතවල ලාභ උවමනාවන් සහ වරප්‍රසාදිත ප්‍රභූවක පෞද්ගලික වස්තු එක්රැස් කිරීම සඳහා වෙනුවට මහජනයාගේ අවශ්‍යතා සැපිරීමට භාවිත කල යුතු ය.

ආර්ථික සුරක්ෂිතතාව යනු ඉසුරුමත් සුලු පිරිසකගේ හිතසුව පිනිස වන වරප්‍රසාදයක් නො ව මූලික මිනිස් අයිතියකි. සියලු කම්කරු ජනයාට සැපපහසු ජීවන තත්වයක් සහතික කර ලීම සඳහා ආර්ථික ජීවිතය සංවිධානය කරන ලෙස සසපය ඉල්ලා සිටී.

## සසපය සමාජ සමානතාව සඳහා සටන් කරයි

කම්කරු පන්තියේ යහපත උදෙසා ඇමරිකාවේ සහ ලෝකයේ ආර්ථිකය යලි සංවිධානගත කිරීම ඉලක්ක කර ගත් වැඩ පිලිවෙලක් සසපය ඉදිරිපත් කරයි. කර්මාන්තයේ හා මූල්‍යයේ සියලු බලවේග පෞද්ගලිකව අයිති කර ගෙන පාලනය කරනු ලබන වර්තමාන ධනවාදී සැකැස්ම මහජනයාට අයිති සමාජවාදී පද්ධතියකින් හා ප්‍රජාතන්ත්‍රවාදීව පාලනය කෙරෙන ආර්ථිකයකින් විස්ථාපනය කල යුතු ය. ලාභ උත්පාදනය සහ දැවැන්ත පෞද්ගලික ධන රැස් කිරීම නො ව මානුෂ අවශ්‍යතා තෘප්ත කිරීම සංවිධාන මූලධර්මය වන ආර්ථික පද්ධතියක් නිර්මානය කිරීම වෙනුවෙන් අපි පෙනී සිටිමු.

කම්කරු පන්තියේ පලල් ජනයාගේ අවශ්‍යතා වෙනුවෙන් ආර්ථික දිවිය යලි සංවිධානය කිරීම සඳහා ආර්ථික පදනම් ස්ථාපනය කිරීමට ඩොලර් බිලියන 10ක් හෝ ඊට වැඩි වටිනාකමක් දරන පෞද්ගලික අයිතියට යටත් කාර්මික, නිෂ්පාදන හා තොරතුරු තාක්ෂනික සංගතයන් -- එක්ව ගත් කල ඇමරිකානු ආර්ථිකයේ තීරනාත්මක කොටසක් පාලනය කරන සමාගම් -- සුලු කොටස් හිමියන්ට මුලු වන්දිය දෙමින් ද විශාල කොටස් හිමියන්ගේ වන්දි කොන්දේසි ප්‍රසිද්ධියේ සාකච්ඡා කර ගෙවීමට එකඟව ද, මහජන අයිතියට පරිවර්තනය කිරීම වෙනුවෙන් අපි පෙනී සිටිමු. එසේ ම, සෞඛ්‍ය ආරක්ෂන සහ ඖෂධ දැවැන්තයන් හා සියලු විශාල බැංකු හා රක්ෂන ආයතන ජනසතු කිරීමට සසපය යෝජනා කරයි. ඊට අමතරව දුම්රිය, ගුවන් සේවා, විදුලි සංදේශ හා බලශක්ති උත්පාදන ජනසතු කිරීම සහ සියලු තීරනාත්මක

ස්වාභාවික සම්පත්, මහජන අයිතිය හා පාලනය යටතේ තැබීම වෙනුවෙන් සසපය පෙනී සිටියි.

මෙම මාවත ඔස්සේ ඇමරිකානු ආර්ථිකය යලි සංවිධානගත කිරීමෙන් කම්කරු පන්තියේ ජීවන තත්වයන් කැපී පෙනෙන ලෙස වර්ධනය කරනු ලබන පිලිවෙත් ක්‍රියාවට නැංවීම සඳහා අතිදැවැන්ත සම්පත් ලබා දෙනු ඇත.

වර්තමානයේ දී රැකියා නොමැති, වැඩ කිරීමේ හැකියාව ඇති සියලු දෙනාට රැකියා සහතික කරනු වස් රජයේ කාර්යයන්ගේ පුලුල් වැඩ පිලිවෙලක් අපි ඉල්ලා සිටිමු. මිලියන ගනනක වැඩ කරන ඇමරිකානුවන්ගේ ආදායම් මට්ටම් ඉහල දැමීමේ හදිසි අවශ්‍යතාව පිරිමැසීම උදෙසා, උද්ධමනය සමග ඉහල යන, සහතික කරන ලද, මධ්‍යම රජයෙන් අරමුදල් සැපයෙන වාර්ෂික ආදායමක් ලබා දිය යුතු ය. රැකියා නිර්මානය කිරීම උදෙසාත් දේශපාලනික සහ සංස්කෘතික දිවියේ කම්කරුවන්ගේ ඉහල සහභාගිත්වයකට ඉඩ සලසනු සඳහාත් වැඩ සතිය 40 පැයක වැටුප් සහිතව 30 පැයට අඩු කල යුතු ය. පූර්නකාලීන කම්කරුවන්ට අඩු ම වසයෙන් සති පහක වාර්ෂික නිවාඩු ලැබිය යුතු ය.

එසේ ම අපි ගුනාත්මකව ඉහල රාජ්‍ය අධ්‍යාපනයක් සහ සියලු දෙනාට ම නොමිලේ ඉහල අධ්‍යාපනයක් ලැබීම සහතික කිරීම වෙනුවෙන් දැවැන්ත ආයෝජනයන් ; පුලුල් සෞඛ්‍ය ආරක්ෂනයක්; සුවපහසු සහ කම්කරුවන්ට මිල දී ගත හැකි නිවාස තැනීමට රාජ්‍ය අනුග්‍රහය ලද නිවාස ඉදි කිරීම්; කම්කරුවන්ට සමිතියකට බැඳීමට හා එය ප්‍රජාතාන්ත්‍රියව පාලනය කිරීමට ඇති අයිතිය සහතික කිරීම; සමිති බිඳීමේ උපාමාරු සහ වැටුප් කප්පාදු නීති විරෝධී කිරීම; සියලු කම්කරු ජනයාට යහපත් ආදායමක් ඇති විශ්‍රාම ආරක්ෂනයන් සහ කුඩා සහ මධ්‍යපරිමාන ව්‍යාපාරයන් සඳහා ආන්ඩුවේ උදව් ලබා දීමට ඉල්ලා සිටිමු.

මෙහි සඳහන් කරන ලද සමාජ අයිතිවාසිකම් සාක්ෂාත් කර ගත හැක්කේ සමාජ සමානතාව ඉහල නැංවීම සඳහා වන සංයුක්ත විධිවිධානයන්ගේ පදනම මත පමනකි. බදු පිලිවෙත ඔලුවෙන් සිටවිය යුතු ය; ප්‍රකෝටිපතියන් සහ මහා ව්‍යාපාරිකයන් ඉසුරුමත් කිරීම සඳහා ජනතාව කොල්ල කෑමේ මාර්ගයේ සිට ධනය රැඩිකල් ලෙස යලි බෙදා හැරීමේ මෙවලමක් බවට එය පත් විය යුතු ය. මෙහි අදහස වනුයේ රොනල්ඩ් රේගන්, ජොෂ්ජ් බුෂ් සහ ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් යටතේ නීතිගත කෙරුන ඉසුරුමතුන් සඳහා වන බදු කප්පාදු අවලංගු කිරීම සහ දේපල බද්ද වැනි ධනය මත වන සෘජු බදු නැවත ඇති කිරීම සහ බොහෝ විශාල සංගතයන් බොහොමයකට තමන්ගේ ලාභයෙන් ඉතා කුඩා අංශුමාත්‍රයකට පමනක් බදු ගෙවීමට සලස්වන නීතියේ සිදුරු සහ ගනකාධිකාරීමය වෙට්ටු අහෝසි කර දැමීම ය. ජනගහනයේ ඉතා විශාල බහුතරයක් සඳහා වන බදු අඩු කල යුතු අතර ඉහල ආදායම් ඇති සහ ගොඩ ගසා ගත් ධනය ඇත්තන්ගේ බදු තියුනු ලෙස ඉහල දැමිය යුතු ය.

පසු ගිය වසර 25හි සමපේක්ෂන ක්‍රියාවන් පිලිබඳව සහ කම්කරුවන්ගේ සහ සුලු කොටස් හිමියන්ගේ වියදම මතින් ප්‍රධාන විධායකයන් විසින් සංගතවල සම්පත් සාපරාධී ලෙස අයුතු පරිහරනයෙහි යෙදීම පිලිබඳව විමර්ශන කිරීම වෙනුවෙන් විශේෂ අවධානය යෙදිය යුතු ය. මෙම සොරා ගත් ධනය ආපසු ලැබිය යුතු අතර එය සමාජ සේවාවන් සහ කම්කරු පන්තියේ ජීවන කොන්දේසි දියුනු කිරීම සඳහා භාවිත කල යුතු ය.

දේපල අයිතිය සමාජ අයිතියට යටත් කල යුතු ය. මෙයින් අදහස් කරන්නේ සියලු දෙය ම ජනසතු කිරීම හෝ දැවැන්ත සංගත හා බැංකු විසින් පීඩනයට ලක් කර තිබෙන සුලු හෝ මධ්‍යපරිමාන කර්මාන්ත අහෝසි කරන බවක් නො වේ. ශිෂ්ටසම්පන්න වැටුප් සහ වැඩ කොන්දේසි සලසන තාක් දුරට, එවැනි ව්‍යාපාරවලට නය පහසුකම් සහ වඩාත් ස්ථාවර වෙලඳ පොල කොන්දේසි සලසා දීමට සැලසුම්ගත ආර්ථිකය ස්ථාපනය කිරීම මගින් මග පෑදෙනු ඇත.

සමාජවාදී සමානතා පක්ෂය සංස්කෘතික ජාතිකවාදය හා ස්ත්‍රීවාදය ඇතුලු අනන්‍යතා දේශපාලනයේ විවිධ පරාසයන්ට විරුද්ධ වේ. ඒ, ඒවායේ අන්තර්ගත භූමිකාව වන්නේ ධනවාදී සමාජයේ අතිමූලික බෙදීම, එනම් සමාජ පන්ති අතර බෙදීම අපැහැදිලි කර දැමීම වන හෙයිනි. සියලු කම්කරු ජනයාගේ සමෝධානයට සහ එකතුවට සහාය දීමේ දී අපි තිරසරව සිටිමු. කම්කරු පන්තියේ උවමනාවන්ට සහ ධනවාදයට එරෙහිව ජාත්‍යන්තර ජනතා ව්‍යාපාරයක් ගොඩ නැගීමේ අවශ්‍යතාවට අතිමූලිකව සතුරු වන්නා වූ වාර්ගික දේශපාලනයට අපි විරුද්ධ වෙමු. දේශපාලනික වසයෙන් තමන් වාර්ගික කොටස් නියෝජනය කරන්නේ යැයි කියා ගන්නා උදවිය එසේ කරන්නේ නිශ්චිත ලෙස ම, කලු වේවා, ලැටිනෝ වේවා නැත හොත් අන් සුලුතරයක වේවා, ධනපති පද්ධතියේ රාමුව ඇතුලත තත්වයන් හා වාසි ගැනීමට මාන බලන පටු, වරප්‍රසාදිත ස්තරයක උවමනාවන් සඳහා ය.

එම සන්දර්භය තුල රැකියා සහ උසස් විද්‍යාලවලට ඇතුලු වීමේ භේදකාරී සටනක සුදු සහ සුලුතර කම්කරුවන් ද සිසුන් ද එකිනෙකා කොටවන සංස්ථාපිතයේ පිලිවෙත්වලට අපි විරුද්ධ වෙමු. එවැනි ක්‍රියා මාර්ග සෙත සලසන්නේ සුලු වාර්ගික බහුතර ජනයාට නො ව වරප්‍රසාදිත ටික දෙනෙකුට පමනකි.

ඉහල වැටුප්, ගුනාත්මක පාසල් හා විශ්වවිද්‍යාල අධ්‍යාපනයක්, මිල දරා ගත හැකි නිවාස සහ අනෙකුත් සියලු සමාජ අවශ්‍යතා සහතික කිරීම සඳහා වන දැවැන්ත සමාජ අයෝජනයක රාමුව ඇතුලත සම්පූර්න සහ අව්‍යාජ සමාන අවස්ථාවන් ලැබිය යුතු යැයි අපි තරයේ පවසමු. කම්කරු ජනතාවගේ සියලු ස්තරයන් අරගලයේ දී ඒකාබද්ධ වන්නා වූ එවන් පිලිවෙතක් මිස වර්ගය හා ලිංගිකත්වය මත අවස්ථාවන් සලාක කොට සීමා කරන්නා වූ පිලිවෙතක් සියලු ජනතාවට ආර්ථික ආරක්ෂනය භුක්ති විඳීමේ හා තම හැකියාවන් උපරිම ලෙස සාක්ෂාත් කිරීමේ අවස්ථාවක් නො සපයනු ඇත.

එසේ ම කලාවට හා සංස්කෘතියට කම්කරු පන්තියට සමීප වීමට සම්පූර්න අවකාශය සැපයෙන විධිවිධාන සලසන සේ ද සමාජවාදී සමානතා පක්ෂය ඉල්ලා සිටී. එක් කලෙක ඇමරිකානු ජනප්‍රිය සංස්කෘතිය ලෝකයේ එක් අරුමයක් වූ අතර එහි නිර්මානශීලිත්වය සහ බලගතු ප්‍රජාතන්ත්‍රවාදී සහ මානුෂීය භාවාර්ථය හේතුවෙන් ආකර්ෂනයේ ධ්‍රැවයක් වී ය. අනෙකුත් ක්ෂේත්‍රවල දී මෙන් ම සංස්කෘතිය ද ලාභ අපේක්ෂා වෙනුවෙන් යටපත් කර දැමීම දැවැන්ත පරිහානියකට මග සැලසී ය.

කලාව සඳහා අරමුදල් කප්පාදුවෙන් සහ කලාත්මක ප්‍රකාශන මත දක්ෂිනාංශික දෘෂ්ටිවාදීමය ප්‍රහාරවල බලපෑමෙන් ජනප්‍රිය සංස්කෘතිය පීඩා වින්දේ ය. කෞතුකාගාර, වාද්‍ය මන්ඩප, නාට්‍යාගාර සහ රූපවාහිනිය හා ගුවන් විදුලිය සඳහා වූ ආන්ඩු සහනාධාර මුලුමනින් අතු ගා දමා තිබේ. බොහෝ රජයේ පාසල්වල කලා හා සංගීත අධ්‍යාපනය දැඩි ලෙස කපා දමා හෝ මුලුමනින් ම අතු ගා දමා හෝ තිබේ. පුස්තකාල පැය ගනන් හා සේවාවන් අඩු කර දමා තිබේ. එවන් මුදලට යට වූ, කලා විරෝධී පිලිස්තීනු ප්‍රවිෂ්ටයක ප්‍රතිඵල ලෙස බුද්ධිමය සහ සදාචාරාත්මක සමාජ වියමනට වන හානිය මිනිය නොහැකි ය. කෙසේ වෙතත්, මිලිටරිවාදය උත්කර්ෂයට නැංවීම, කෲරත්වය සහ ආත්ම විභූෂනය සමග පූර්ව පරම්පරාවල කලාත්මක හා සංස්කෘතිකමය උරුමයන්ට දක්වන වෛරය අතර අවිවාදාත්මක සම්බන්ධයක් තිබේ.

සමාජවාදී සමානතා පක්ෂය කලාව සඳහා ද, ජනගහනයේ සියලු ම කොටස්වලට සංගීතය, නර්තනය, නාට්‍යය සහ කලාව සඳහා සාමාන්‍ය ශාස්තුවක් යටතේ හෝ මුලුමනින් ම නොමිලේ ප්‍රවේශ වීමට අවකාශය සහතික කරනු වස් නව පාසල් හා මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා ද දැවැන්ත අරමුදල් සපයන ලෙස ඉල්ලා සිටී. කලාව සඳහා සහනාධාර හා දීමනා පිලිබඳව තීන්දු ගැනීම දේශපාලනඥයන් හා නිලධාරි තන්ත්‍රයන් අතින් ඉවත් කර කලාකරුවන්, සංගීතඥයන් හා අනෙකුත් සංස්කෘතික ක්‍රියාධරයන්ගේ කමිටුවක් යටතට පත් කල යුතු ය.

පෘථිවියේ සීමිත සම්පත්වල යථාවාදී සංවර්ධනයක් උදෙසා සහතික විය හැක්කේ සමාජවාදී ආර්ථික ක්‍රියා මාර්ගයකට පමනකි. සියලු මිනිස් ක්‍රියාකාරකම් ලාභය සඳහා වැයමට සහ පෞද්ගලික ධනය ගොඩ ගසා ගැනීමට යටත් කිරීම පරිසර ව්‍යසනයක් දිගේලි කිරීමේ තර්ජනය ඇති කරයි. මෙයට හෝ ජනතා සමාජයේ ඉහල යන සංකීර්න අවශ්‍යතා විසින් මතු කරනු ලබන අනෙකුත් ගැටලු එකකට හෝ මුහුන දීමට ලාභ පද්ධතියට ඇති නොහැකියාව මිනිස් වර්ගයාගේ නො නැසී පැවැත්මට මාරක තර්ජනයක් මතු කරයි. සමාජවාදී ආර්ථික සැලැස්ම පෘථිවියේ පරිසරය රැක ගැනීමේ දී අව්‍යාජ ගෝලීය සහයෝගිතාවකට කොන්දේසි නිර්මානය කරනු ඇත.

## කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සඳහා

ඇමරිකාව ඇතුලත ද ජාත්‍යන්තරව ද යුද්ධයට, මර්දනයට සහ ජීවන තත්වයන්ට හා ප්‍රජාතාන්ත්‍රිය අයිතීන්ට ප්‍රහාර එල්ල කිරීමට එරෙහිව අරගලයක් ගෙන යාමේ පූර්ව කොන්දේසිය වනුයේ කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය තහවුරු කිරීම ය. සමාජවාදී සමානතා පක්ෂයේ උද්ඝෝෂනය ප්‍රධාන කොට ම ඉලක්ක කර ගෙන තිබෙන්නේ ඇමරිකානු කම්කරු පන්තියේ ස්වාධීන ජනතා පක්ෂය ලෙස සසපය වර්ධනය කිරීම සඳහා දේශපාලන පදනම ඇතිරීම මගින් මෙම අත්‍යවශ්‍ය කාර්යය ජය ගැනීම කෙරෙහි ය.

කම්කරු පන්තිය මුහුන දෙන ඉතා ම හදිසි දේශපාලන කර්තව්‍යය වනුයේ ඩිමොක්‍රැටික් පක්ෂයෙන් සහ ''ද්විපක්ෂ ක්‍රමයේ'' සමස්ත හවුල්කාර රාමුවෙන් මුලුමනින් ම බිඳී වෙන් වීම බව සසපය අවධාරනය කරයි. ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් පක්ෂවල වෙනස්කම් පවතින්නේ ඇමරිකාවේ හා ගෝලීයව ධනපති ප්‍රභූවේ උවමනාවන් සුරක්ෂිත කිරීමේ හොඳ ම ආකාරය පිලිබඳ උපාඋපක්‍රමවල ස්වභාවය පිලිබඳව ය.

බුෂ් විසින් කොන්ග්‍රසය, නීතිය හා ව්‍යවස්ථාව අවඥාවට ලක් කිරීමට සහ ජනාධිපති ඒකාධිපතිත්වයක් සඳහා රාමුව සංස්ථාපනය කිරීම පිලිබඳව කිසිදු බැරෑරුම් විරුද්ධත්වයක් ඩිමොක්‍රැටික් පක්ෂය ඉදිරිපත් නො කරයි. බොහෝ කලකට පෙර ඩිමොක්‍රැටික් පක්ෂය විසින් සමාජ ප්‍රතිසංස්කරනයේ සියලු පිලිවෙත් අත හැර දමනු ලැබූ අතර කම්කරු ජනයාගේ වියදම මතින් ඉසුරුමත් ම සමාජ ස්තරය තවතවත් ධනවත් කිරීමට සැලසුම් කල පිලිවෙත් වැලඳ ගත්තේ ය. ද්විපක්ෂ පද්ධතියේ රාමුව ඇතුලත එහි විශේෂිත ක්‍රියාකාරිත්වය වනුයේ පහලින් මතු වන සමාජ විරෝධතාවේ ඕනෑ ම

ව්‍යාපාරයක් හිර කර නිෂ්ක්‍රිය කිරීම පිනිස " මහජනයාගේ" පක්ෂය ලෙස පෙනී සිටීම ය.

## සසප උද්ඝෝෂණයට සහාය දෙන්න

ලෝක සමාජවාදී වෙබ් අඩවියේ දහස් ගනනක් වන පාඨකයන්ගෙන් ද සසප හිතවතුන්ගෙන් ද යුද්ධයේ පිලිවෙත්වලට, මර්දනයට, කම්කරු පන්තියේ ජීවන තත්වයන්ට පහර දීමට විරුද්ධ සියලු දෙනාගෙන් ද අපගේ මැතිවරන ව්‍යාපාරයට ක්‍රියාශීලීව සහාය දෙන ලෙස සමාජවාදී සමානතා පක්ෂය ඉල්ලා සිටී.

ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් පක්ෂවලට ද අන්‍යෝන්‍යාව මඩ ගසා ගැනීමේ හා බොරු දෙසීමේ ඔවුන්ගේ මැතිවරන ව්‍යාපාරයට ද මුදල් සපයන්නා වූ ඇමරිකානු සංගත ක්ෂේත්‍රයේ සහ සුපිරි ඉසුරුමතුන්ගේ බිලියන ගනන් වන දායකත්වයන් වෙත සසප උද්ඝෝෂනයට ප්‍රවේශයක් ඇත්තේ නැති අතර එයට උවමනාවක් ද නැත. කම්කරු පන්තියේ දේශපාලන විඥානය ඉහල දමමින් අප අත්පත් කර ගැනීමට තැත් කරන දෙය සාක්ෂාත් කර ගත හැක්කේ කම්කරුවන්, වෘත්තිකයන්, තරුන ජනයා හා ශිෂ්‍යයන් පුලුල්ව බලමුලු ගන්වන, මැතිවරනයෙන් මත් එපිටට යන්නා වූ සාමාන්‍ය මහජනතාවගේ දේශපාලන ව්‍යාපාරයක් වර්ධනය කරමින් කම්කරු පන්තියේ බහුජන සමාජවාදී පක්ෂයකට අඩිතාලම දැමීමෙනි.

අපි මෙම අභියෝගය අපගේ හිතවතුන් ඉදිරියේ තබමු. සසප මැතිවරන ව්‍යාපාරය ප්‍රසිද්ධ කිරීමේ ප්‍රයත්නයේ දී අප හා එක් වන්න, අපගේ අපේක්ෂකයන්හට සහයෝගය දිනා දෙන්න, කම්කරුවන් හා තරුනයන් අතර අපගේ ක්‍රියා මාර්ගය පිලිබඳ දේශපාලන සාකච්ඡා සංවිධානය කරන්න. ඔබ පදිංචි ප්‍රදේශය තුල, ඔබගේ වැඩපලෙහි සහ පාසල්වල සසප උද්ඝෝෂනයට සවන් දීමට රැස්වීම් කැඳවන්න. මෙම මැතිවරන ප්‍රකාශන පත්‍රිකාව හැකි තරම් පුලුල් ලෙස බෙදා හරින්න. සසපය කම්කරු ජනයාගේ නව දේශපාලන පක්ෂය ලෙස ගොඩ නැගීමට උදව් වන්න.

මෙම ව්‍යාපාරය කර ගෙන යාමේ දැවැන්ත බාධකයන්ට මුහුන දීමට සිදු වන බව අපි වටහා ගෙන සිටිමු. ඇමරිකානු දේශපාලන පද්ධතිය බරපතල ලෙසින් ම ප්‍රජාතන්ත්‍ර විරෝධී ය. ද්විපක්ෂ ක්‍රමය සියලු ස්වාධීන විකල්පයන්, විශේෂයෙන් ම වාමාංශික විකල්පයන් ඡන්දයෙන් ඉවත් කර තැබීමට වෑයම් කරමින් තමන් ම චිරස්ථායී කර ගෙන තිබේ. ඔවුන් මෙය සපුරා ගනුයේ ස්වාධීන හා තුන් වන පාර්ශ්ව අපේක්ෂකයන් සඳහා හිතුවක්කාර සහ බාධාකාරී අත්සන් ක්‍රමයක් පටවන, ඡන්ද ලබා ගැනීමට පහසු කරනවාට වඩා බාධාකාරී වන නාමයෝජනා පෙත්සම් සඳහා අවසන් දින පනවන මැතිවරන නීති රොත්තක් හරහා සහ විවේචනාත්මක අදහස්, විශේෂයෙන් ම සමාජවාදීන්ගේ අදහස් ක්‍රමානුකූලව බැහැර කර තබන සංගතපාලිත මාධ්‍යය හරහා ය.

එසේ වුව ද අපි අධිෂ්ඨානශීලී උද්ඝෝෂන ව්‍යාපාරයක් ගෙන යාමට අදහස් කර ගෙන සිටිමු. අප එසේ කරනුයේ මූලධර්මාත්මක සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී ක්‍රියා මාර්ගයක පදනමෙහි සහ කම්කරු ජනයා අතර මෙම ක්‍රියා මාර්ගයට වර්ධනය වන පදනමක් ලැබේ ය යන විශ්වාසය මත ය. උද්ඝෝෂනයේ පරිමාව, අපට යෙදිය හැකි වන අපේක්ෂකයන් ගනන, අපට තරග කල හැකි වන කොට්ඨාස ගනන, අපට උද්ඝෝෂනය ගෙන යා හැකි වන ප්‍රාන්ත හා ප්‍රදේශ ගනන රඳා පවතින්නේ මැතිවරනයට සසප අපේක්ෂකයන් ඇතුලු කිරීමට උදව් වීමට පෙරට පැමිනෙන කම්කරුවන්ගේ, ශිෂ්‍යයන්ගේ හා තරුනයන්ගේ සහයෝගය හා සහභාගිත්වය මත ය.

## සමාජවාදය සඳහා සටනට එක් වන්න

සමාජවාදී සමානතා පක්ෂය ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ ශ්‍රේෂ්ඨ සම්ප්‍රදායයන් මත තමන් පදනම් කර ගනී. සමානතාව, මානුෂීය සහෝදරත්වය හා සහයෝගිතාව සහ පීඩනයෙන්, හිඟයෙන් ද්‍රව්‍යමය ලෙස හා භාවාත්මක ලෙස මිනිස් වර්ගයා විමුක්ත කර ගැනීම වෙනුවෙන් සමාජවාදය පෙනී සිටී. සමාජවාදයේ ප්‍රථම කාර්යය වනුයේ දුගී බව මුලිනුපුටා දැමීම ය. එම අරමුන, මිනිසාගේ නිෂ්පාදන බලවේගයන්ගේ දැවැන්ත වර්ධනය සහ විද්‍යාවේ හා තාක්ෂනයේ අතිවිශාල පෙරට යාම් අනුව පැහැදිලිව ම සපුරා ගත හැකි ය. සමාජවාදය පුලුල් වසයෙන් මනුෂ්‍ය වර්ගයාගේ ජීවන තත්වයන් ඉහල නැංවීමට ද සම්පූර්න සමානාත්මතාව සඳහා කොන්දේසි නිර්මානය කිරීමට ද පෙරට යනු ඇත.

එහෙත් මිනිසාට ආහාරයෙන් පමනක් ජීවත් විය නොහැකි අතර එතරම් ම තීරනාත්මක වුවත් ආසන්නතම ද්‍රව්‍යමය අවශ්‍යතා සැපිරීමෙන් පමනක් සමාජවාදී ඉදිරි දර්ශනය නො නවතී. එම ජයග්‍රහනය සංස්කෘතියේ, විද්‍යාවේ සහ තනි තනි පිරිමියාගේ සහ ගැහැනියගේ බුද්ධිමය සහ සදාචාරමය ආරෝහ සම්පත්තියේ දැවැන්ත මල්ඵල හට ගැනීමක් සඳහා පදනම දමයි. නිෂ්පාදන මාර්ගවල, ජාත්‍යන්තර සැලසුම්කරනයේ සහ සහයෝගයේ සමාජමය අයිතිය තිබෙන ලොවක ජනතාවගේ දක්ෂතා, උවමනාවන් සහ ශක්‍යතා සාක්ෂාත් කල හැකි පරිපූර්න සංවර්ධනයකට සමාජවාදය තුලින් ඉඩ සැලසෙන අතර ජනතා සහභාගිත්වයේ හා ප්‍රජාතාන්ත්‍රිය පාලනයේ දැවැන්ත පුලුල් වීම මිනිසාට දිරියබල සිඳින ආර්ථික අවදානමේ ඇඹරුම් ගලින් ද බල්ලන් විසින් බල්ලන්

සපා කන තරගකාරිත්වයේ අමානුෂික බලපෑමෙන් ද ගැලවී ගැනීමට හැකියාව ලබා දෙයි.

කාල් මාක්ස්ගේ ආගමනයත් සමග සමාජවාදය විද්‍යාවක් බවට පත් විය. 1917 විප්ලවයත් සමග එය ධනවාදය පෙරලා දමා පලමු කම්කරු රාජ්‍යය වන සෝවියට් සංගමය ස්ථාපනය කල දැවැන්ත ජනතා ව්‍යාපාරයේ ක්‍රියා මාර්ගය විය.

රුසියානු විප්ලවය සමාජ සමානතාව සඳහා වූ කම්කරු පන්තියේ පලල් ජාත්‍යන්තර අරගලයේ කොටසක් විය. පැය අටේ වැඩ දිනයේ සිට ලමා ශ්‍රමිකයන් පිලිබඳ නීති, සියල්ලන්ට රාජ්‍ය අධ්‍යාපනය, දැවැන්ත කාර්මික සමිති පිහිටුවීම හා දකුනේ ජිම් ක්‍රෝ වෙන් කර තැබීම් අවසන් කර දැමීම දක්වා වූ ඇමරිකානු කම්කරු පන්තියේ සියලු ප්‍රධාන ඉදිරි පියවර සමාජවාදය සමග බැඳී තිබූ අතර ඒවා මෙහෙයවනු ලැබුවේ සමාජවාදී මතධාරී සටන්කාමීන් විසිනි.

වෙනත් බොහෝ ශ්‍රේෂ්ඨ ආදර්ශයන් සේ ම සමාජවාදය ද අපහරනයට ලක් කර සහ පාවා දී තිබේ. සෝවියට් සංගමය තුල දී සමාජවාදය ජෝශප් ස්ටැලින් යටතේ පැන නැගුන නිලධර තන්ත්‍රය විසින් පාවා දෙනු ලැබී ය. ස්ටැලින්වාදය රුසියානු විප්ලවයේ සමානාත්මවාදයේ සහ ජාත්‍යන්තරවාදයේ උරුමයේ අඛන්ඩතාව නො වේ. එය "තනිරටේ සමාජවාදයේ" ජාතිකවාදයේ වැඩ පිලිවෙල මත පදනම් වූ විප්ලවයට එරෙහි ආධානග්‍රාහී නිලධාරීතාන්ත්‍රීය ප්‍රතික්‍රියාවකි. ස්ටැලින්වාදී නිලධාරි තන්ත්‍රය කම්කරු ප්‍රජාතන්ත්‍රවාදය කුඩුපට්ටම් කර දමා, ඒකාධිපති පාලනයක් බල ගන්වා, අව්‍යාජ මාක්ස්වාදය මරා දමා ලොව පුරා කම්කරු පන්තියේ විප්ලවවාදී අරගල වෙනතකට හරවා දැමී ය. මේ සියල්ල කෙරුනේ 'සමාජවාදයේ' නාමයෙනි. රුසියානු විප්ලවය හා සමාජවාදය මෙලෙස පාවා දීම, 1990 ගනන් මුල දී සෝවියට් සංගමය බිඳ හෙලීමේ හා ධනවාදය පුනස්ථාපනය කිරීමේ ක්‍රියාවට ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය සමග ක්‍රෙම්ලින නිලධරය සෘජුව සහයෝගී වීමෙන් කූටප්‍රාප්තියට පත් විය.

ඇමරිකාව තුල වෘත්තීය සමිති ඇතුලතින් පැන නැගුන නිලධාරි තන්ත්‍රය විසින් කම්කරු පන්තියේ අරගල පාවා දෙනු ලැබී ය. කම්කරු නිලධරය ධනපති පද්ධතිය ආරක්ෂා කල අතර, මූලිකව ම ඩිමොක්‍රැටික් පක්ෂය සමග වූ ඔවුන්ගේ සන්ධානය හරහා කම්කරුවන් ඇමරිකාවේ මහා ව්‍යාපාරයට දේශපාලනිකව යටත් කරනු ලැබී ය. ඒඑෆ්එල්-සීඅයිඕ නිලධරයේ පාවා දීම්, වෘත්තීය සමිති සංගත කලමනාකාරිත්වය සමග අනන්‍ය වීමට සහ ඒවා කම්කරු පන්තිය ආරක්ෂා කරනවා වෙනුවට මර්දනය කිරීමේ මෙවලම් බවට පරිවර්තනය කිරීමට ඉවහල් විය.

අපගේ ව්‍යාපාරය, නිලධර තන්ත්‍රයට එරෙහිව සමාජවාදය වෙනුවෙන් සටන් කල කම්කරු පන්තියේ හොඳ ම, ඉතා ම ධෛර්යසම්පන්න සහ දූරදක්නා නියෝජිතයන්ගේ උරුමයන් මත තමන් පිහිටුවා ගනී. මෙම සම්ප්‍රදායේ ශ්‍රේෂ්ඨතම ප්‍රතිමූර්තිය වනුයේ ස්ටැලින්වාදයේ පාවා දීම්වලට එරෙහි අරගලයට නායකත්වය දුන් රුසියානු විප්ලවයේ නායකයකු වූ ද 1938 දී සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය වූ හතර වන ජාත්‍යන්තරය සඳහා අත්තිවාරම දැමීම හරහා ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ යලි ඉපදීමට පදනම දැමුවා වූ ද ලියොන් ට්‍රොට්ස්කි ය.

ඇමරිකාව ද සමාජවාදය වෙනුවෙන් පෙනී සිටි ශ්‍රේෂ්ඨ සටන්කාමීන්, කම්කරු නිලධරය හා සටන් කර කම්කරු පන්තියේ විමුක්තිය උදෙසා සිය ජීවිත කැප කල පිරිමින් සහ ගැහැනුන් බිහි කර තිබේ. ඔවුන් අතර බිග් බිල් හේවුඩ්, ඉයුජින් ඩෙබ්ස් සහ ජේම්ස් කැනන් වැනි ප්‍රතිරූපයෝ වෙති. ඇමරිකානු කම්කරුවන්, මහජනතාවගේ අවශ්‍යතා උදෙසා සමාජය පරිවර්තනය කිරීම සඳහා ද ඇමරිකාවේ සහ ලෝකයේ දරිද්‍රතාව, සූරා කෑම සහ මර්දනය අවසන් කර දැමීම සඳහා ද අද දවසේ අරගලය සංවිධානය කරනු පිනිස මෙම පොහොසත් සමාජවාදී උරුමය යලි අත්පත් කර ගත යුතු ය.

යුද්ධයට, මිලිටරිවාදයට හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරයන්ට විරුද්ධ වන, සමාජ සමානාත්මතාව සඳහා කරන සටනට සහයෝගය දෙන සියලු දෙනාට ම සමාජවාදී සමානතා පක්ෂය සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* හා සම්බන්ධ වන ලෙසත් තමන්ගේ ප්‍රාන්තයේ හා ප්‍රාදේශිකයේ ඡන්දයට සසප අපේක්ෂකයන් ඇතුලු කිරීමේ පෙත්සම් ව්‍යාපාර සංවිධානය කිරීම සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන ලෙසත් අපි ඉල්ලා සිටිමු. සමාජවාදී සමානතා පක්ෂයේ වැඩ පිලිවෙල සමග එකඟ වන අයට සසප අපේක්ෂකයන් ලෙස තමන් ම ඉදිරිපත් වීමට පෙරට පැමිනෙන ලෙස අපි උදක් ම ඉල්ලා සිටිමු.

© www.wsws.org